**වෙස්ට් කෝස්ට් පවර් (ප්‍රයිවට්) ලිමිටඩ් - 2016/2017**

**------------------------------------------------------------------**

වෙස්ට් කෝස්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්හි 2017 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහාවූ ලාභ හා අලාභ ප්‍රකාශනය හා වෙනත් විස්තීර්ණ ආදායම්, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කල යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මෙම විගණනයේදී, මා විසින් ප්‍රසිද්ධ වෘත්තියේ නියැලුණු වරලත් ගණකාධිකාරී සමාගමක සහාය ලබාගන්නා ලදී.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම

**-------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ ("මණ්ඩලය") වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**---------------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

------------------

### 2.1 මතය

------

මූල්‍ය ප්‍රකාශනවලින් 2017 මාර්තු 31 දිනට වෙස්ට් කොස්ට් පවර් (ප්‍රයිවට්) ලිමිටඩ්හි මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 2.2 කරුණු අවධාරණය කිරීම

-------------------------------

අඛණ්ඩ පැවැත්මක් ලෙස පවත්වාගෙන යාමට සමාගමට ඇති හැකියාව පිළිබඳව වැදගත් සැකයක් ඇති කිරීම කෙරෙහි හේතුවන ප්‍රමාණවත් අවිනිශ්චිතතාවය පැවැත්ම පැහැදිලි කරන, මූල්‍ය ප්‍රකාශන 2.3 සටහන් වෙත මාගේ අවධානය යොමු කරමි.

### 2.3 වෙනත් තොරතුරු

----------------------

වෙස්ට් කෝස්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්හි 2016 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ප්‍රසිද්ධ වෘත්තියේ නියුතු වරලත් ගණකාධිකාරී සමාගමක් විසින් විගණනය කරන ලද අතර, 2016 අගෝස්තු 19 වන දින මූල්‍ය ප්‍රකාශන පිළිබඳව තත්ත්වාගණනය නොකළ මතයක් ප්‍රකාශ කරන ලදි.

### 2.4 වෙනත් නීතිමය හා නියාමන අවශ්‍යතාවයන් පිළිබඳ වාර්තා කිරීම

--------------------------------------------------------------------------------

2007 අංක 07 දරන සමාගම් පනතේ 163 (2) වගන්තියේ නියමය පරිදි, පහත සඳහන් කරුණු මම ප්‍රකාශ කරමි.

(අ) මතය සඳහා පදනම හා විෂය පථය සහ විගණනයේ සීමා කිරීම් ඉහත පරිදි දක්වනු ලැබේ.

(ආ) මාගේ මතය වනුයේ,

- විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු හා පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලද බවත්, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සමාගම විසින් විධිමත් ගිණුම්කරණ වාර්තා පවත්වා ඇති බවත්,
- සමාගමේ මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියෙහි අවශ්‍යතාවයන්ට අනුකූලව ඉදිරිපත් කර ඇති බවත්ය.

## 3. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵලය

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ මෙහෙයුම්වලින් වූ ප්‍රතිඵලය රු.9,679,102,580 ක බදු පෙර ශුද්ධ ලාභයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ බදු පෙර ශුද්ධ ලාභය රු. 10,545,059,397 ක් වූ බැවින්, ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.865,956,817 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. ආදායම රු.1,221,573,470 කින් වැඩි වී තිබුණද, වෙනත් මෙහෙයුම් ආදායම රු.1,529,447,595 කින් අඩුවීම හා විකුණුම් පිරිවැය රු.557,935,248 කින් වැඩිවීම, මෙම පිරිහීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්යසාධනය**

**4.1.1 සැලසුම් කිරීම**

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුල්‍ය චක්‍රලේඛය ප්‍රකාරව සමාගම විසින් සංයුක්ත සැලැස්මක් සහ ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්**

ශ්‍රී ලංකා ඛනිජ තෙල් සංස්ථාව හා වෙස්ට් කෝස්ට් පවර් (ප්‍රයිවට්) ලිමිටඩ් අතර එළඹ ඇති ගිවිසුමෙහි 5.3 වගන්තිය අනුව, ශ්‍රී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙන් ඉන්ධන මිලදී ගැනීම සඳහා ගෙවීම්, ඉන්වොයිසි නිකුත් කිරීමෙන් පසු සත් වන දින හෝ ඊට පෙර සිදු කළ යුතුය. කෙසේ වෙතත්, ශ්‍රී ලංකා ඛනිජ තෙල් සංස්ථාවෙන් ඉන්ධන මිලදී ගැනීම සඳහා ප්‍රමාද ගාස්තුවලට අදාළව 2017 මාර්තු 31 දිනට ගෙවිය යුතු පොළී ගාස්තු ලෙස රු.6,205,363,960 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

**4.3 මානව සම්පත් කළමනාකරණය**

සමාගම විසින් බඳවා ගැනීමේ පරිපාටියක් (SOR) පිළියෙල කර නොතිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**5.1 අභ්‍යන්තර විගණනය**

සමාගම විසින් සමාලෝචිත වර්ෂය සඳහා අභ්‍යන්තර විගණන කටයුතු සිදුකර නොතිබුණි.

**5.2 විගණන කමිටුව**

සමාගම විසින් සමාලෝචිත වර්ෂය සඳහා විගණන කමිටු පවත්වා නොතිබුණි.

**5.3 ප්‍රසම්පාදන සැලැස්ම**

සමාගම විසින් 2017 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**5.4 අයවැය ලේඛනමය පාලනය**

සමාගම විසින් සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික අයවැය ලේඛනයක් පිළියෙල කර නොතිබුණි.